අරණායක ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය 2014 අප්‍රේල් 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 24 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම</u>

2010 ජනවාරි 19 දිනැති අංක PED 54 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍ර ලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට සියලුම පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිතීන් අනුගමනය කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂය තුලදී ඉකුත් වර්ෂයන් වෙනුවෙන් පළාත් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවන ලද රු. 550,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතුව තිබූ එකතුව රු. 92,412 ක්, වියදම් හා ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරියෙකුගේ රු. 149,290 ක ආපදා ණය ශේෂයක් සේවක ණය ගිණුමෙන් අත්හැරී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබූ රු. 8,171,862 ක මුද්දර ගාස්තු ආදායමක් ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ගණනය කිරීමේදී සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ එකතුව රු. 3,048,000 ක් වූ වාහන 04 ක් අයිතිය පවරා ගැනීමකින් තොරව සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

1.3.3 <u>අසම්භාව්‍ය බැරකම්</u>

සභාවේ වත්කම් හා වගකීම් වලට අදාල නීතිමය හා වෙනත් බැඳීම් සම්බන්ධයෙන් පවතින අසම්භාව්‍ය බැරකම් වලට අදාල විස්තර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

1.3.4 <u>නොසැසඳුන පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 9,037,042 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 9,980,427 ක් වූයෙන් වෙනස රු. 1,096,485 ක් විය.

1.3.5 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2002 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 672,333 ක් වූ අවිනිශ්චිත ගිණුම්වල බැර ශේෂයන් සමාලෝචිත වර්ෂය තුලදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 <u>ලැබිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට පැවති නිරවුල් නොකල අත්තිකාරම් ගිණුම්වල වටිනාකම රු. 2,705,295 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 139,904 ක් විය.

1.3.7 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් එකතුව රු. 5,952,345 ක් වූ ගිණුම් විෂයයන් 02 ක්, ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

1.3.8 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 17 (1), (2) හා (3) වගන්ති | (i) සභාවට අයත් ඉඩම් කොටස් 36 ක් අනවසර පදිංචිකරුවන් 17 ක් විසින් දීර්ඝ කාලයක සිට නිවාස හා ව්‍යාපාරික ගොඩනැගිලි ඉදිකරගෙන බුක්ති විදිමින් පැවතියද, එම දේපල ආරක්ෂා කර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.<br>(ii) උස්සාපිටිය වෙළඳ සංකීර්ණය අසල සභාවට අයත් නිවාස 02 ක් මුදල් අයකිරීමකින් තොරව සංස්කෘතික මධ්‍යස්ථානයකට හා පෞද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාමට ඉඩදී තිබුණි.<br>(iii) සභාවට අයත් නාගරික බල සීමාවේ පිහිටි ඉඩම් කොටස් 34 ක් වගා කටයුතු සඳහා වාර්ෂිකව බදු දී තිබූ අතර, 2001 වර්ෂයෙන් පසු බදු ගිවිසුම් වලට එළඹ නොතිබුණද, බද්දට ඉඩම් කොටස් ලබා ගත් තැනැත්තන් එම ඉඩම් වල ස්ථිර නිවාස ඉදි කර ගනිමින් බදු මුදල් ගෙවීම් පැහැර හරිමින් හා බදු ගිවිසුම් වලට එළඹීම මගහරිමින් තිබුණද, සභා දේපල ආරක්ෂා කර ගැනීම උදෙසා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1998/12/10 දිනැති අංක 98/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | භාවිතයේ පවතින ගිවිසුම් පත්‍ර ආකෘතිවල අඩුපාඩු පවතින බැවින් ඒවා අවම කර ගැනීම පිණිස හඳුන්වා දුන් බදු ගිවිසුම් පත්‍ර 1999 |

| | | |
|---|---|---|
| | | වර්ෂයේ සිට අනුගමනය කරන ලෙස දන්වා තිබුණද, ඊට අනුගත නොවීමෙන් 2013 දෙසැම්බර් 31 දින දක්වාම මාසික බදු කුලී ගෙවීම් කිරීමේදී ප්‍රමාද කරනු ලබන එක් එක් මාසය සඳහා වෙන වෙනම දඩ ගණනය කිරීම හේතුවෙන් අයකලයුතු ප්‍රමාද දඩ අයකර ගත නොහැකිව පැවතුණි. |
| (ඇ) | 1987 අංක 15 දැන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය හා 2005/04 හා 2005 ජූනි 01 දිනැති සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අක්කර 19 රූඩ් 01 ක ප්‍රමාණයෙන් යුතු ඉඩම් 03 ක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා කට්ටි සැලසුම් අනුමත කිරීමට පෙර තාවකාලික තක්සේරුව මත 1% ක අත්තිකාරම් මුදල් ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, වෙන්දේසිකරුවන් සමඟ ගිවිසුම් වලටද එළඹ නොතිබුණි. විකුණුම් වලට අදාල ඉඩම් වලින් 10% ක බිම් ප්‍රමාණයක් සභාවට පවරා ගැනීමටද පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා 2012 දෙසැම්බර් 07 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ අංක 1788 දරන ගැසට් පත්‍රය | 2013 අප්‍රේල් 30 දිනට පෙර බලපත්‍ර ගාස්තු නොගෙවන ලද තැනැත්තන්ට එරෙහිව නීති මඟින් කටයුතු කර බලපත්‍ර ගාස්තුව දඩ මුදලක් ලෙස අයකරගත යුතු වුවද, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාරික ස්ථාන 14 කින් අයකර නොගත් බලපත්‍ර ගාස්තුව රු. 13,350 ක් විය. |
| (ඉ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව 5.8 වගන්තිය | වටිනාකම රු. 25,759,965 ක් වූ වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් තහවුරු වී නොතිබුණි. |

02. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,686,135 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 1,078,050 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු. 11,764,185 ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම් 179% කින් පමණ වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය

| | ඇස්තමේ-<br>-න්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට<br>සමුච්චිත<br>හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 1,819 | 1,256 | 562 |
| (ii) බදු කුලී | 2,142 | 1,781 | 360 |
| (iii) බලපත්‍ර ගාස්තු | 661 | 723 | (62) |
| (iv) වෙනත් ආදායම් | 17,580 | 13,608 | 3,972 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු වටිනාකම රු. 6,071,268 ක් විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනතුරුදායක ගස් ඉවත් කර ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ පැමිණිලි පරීක්ෂා කර සභාවට වාර්තා කිරීම සඳහා කාර්මික නිලධාරීවරයාට යොමු කර තිබුණද, පරීක්ෂා කිරීම් ඉටුකර නොතිබූ අවස්ථා 20 ක් පැවතුණි.

(ආ) සභාවට භාණ්ඩ හා සේවා සපයා ගැනීම පිණිස පත්කර ගෙන තිබූ ප්‍රසම්පාදන මණ්ඩලය මහජන නියෝජිතයන්ගෙන් පමණක් සමන්විතව තිබූ අතර, එක් එක් කාර්යභාරයට අදාලව තාක්ෂණික හා විෂය දැනුම ඇති නිලධාරීන් සහභාගි කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

රු. 50,000 ක ප්‍රතිපාදන යටතේ ඉදි කරන ලද ගංතුන බෝධිරාජ මාවත කොන්ක්‍රීට් කිරීමට අදාල කර්මාන්තයේ අනුමත වැඩ ඇස්තමේන්තුව අනුව, අඟල් 6 ක් ඝනකමින් අඩි 8 ක් පළලට අඩි 28 ක් දිගට කොන්ක්‍රීට් කලයුතු වුවද, අඟල් 2 සහ 3 ප්‍රමාණයේ ඝනකමින් යුක්තව අඩි 8 ක් පළලින් අඩි 80 ක් දිගට ඉදි කර තිබුණි. මෙම ඉදි කිරීමේ අනුමත ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමිතියෙන් බැහැරව සිදු කර තිබූ අතර, එම හේතුවෙන් මෙම මාර්ගයේ වාහන ධාවනය සඳහා යොදා ගත නොහැකිව තිබුණි.

04. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>අභ්‍යන්තර විගණනය</u>

1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) තොග පාලනය